# 7029 - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදී යාම

**I පත්‍රය** = කාලය පැය 02 යි

වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 50 කි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.

**II පත්‍රය** = කාලය පැය 03 යි

ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 07 කින්, 5 කට පිළිතුරු සැපයිය යුතුයි. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින්

මුළු ලකුණු 100 කි.

**අවසාන ලකුණු ගණනය කිරීම :**

I **පත්‍රය** = 100

II **පත්‍රය** = 100

**අවසාන ලකුණු** = 200 ÷ 2 = 100

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන්ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ :ප්‍රශ්න අංක 03**

(i) ....................................................
....................................................
.................................................... √ △ $\frac{4}{5}$

(ii) ....................................................
....................................................
.................................................... √ △ $\frac{3}{5}$

(iii) ....................................................
....................................................
.................................................... √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණු ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව/පැරණි නිර්දේශය – புதிய/பழைய பாடத்திட்டம் – New/Old Syllabus

NEW/OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I
தொடர்பாடலும் ஊடகக் கற்கையும் I
Communication and Media Studies I

29 S I

2019.08.30 / 0830 - 1030

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** ජනමාධ්‍යයන්ගේ පැවැත්ම සඳහා මූලික ව අවශ්‍ය වන්නේ කුමක් ද?
(1) අදහස් (2) සංවිධාන (3) ආයතන (4) තොරතුරු (5) සාක්ෂරතාව

**2.** සන්නිවේදන ආකෘතියක් තුළ දී ආකල්ප පිළිබඳව විවරණය කරන්නේ,
(1) ඩේවිඩ් කේ. බර්ලෝ ය. (2) ෂැනන් හා වීවර් ය.
(3) විල්බර් ශ්‍රාම් ය. (4) හැරල්ඩ් ඩී. ලැස්වෙල් ය.
(5) චාල්ස් ඔස්ගුඩ් ය.

**3.** ගුරුවරයා පන්තියේ දී භාවිත කළ වචන කිහිපයක අර්ථය වටහා ගත නොහැකි වූ සිසුහු විශ්වකෝෂය පෙරළා බැලූහ. මෙම අවස්ථාවේ සිසුන්ගෙන් සිදු වූයේ,
(1) අර්ථකථනයකි. (2) ආකේතිකරණයකි.
(3) විකේතිකරණයකි. (4) පරිවර්තනයකි.
(5) විශ්ලේෂණයකි.

**4.** රටක විකල්ප මාධ්‍ය භාවිතය ප්‍රචලිත වීමට ප්‍රධානතම හේතුව වන්නේ,
(1) නව මාධ්‍ය ප්‍රබල වීමයි. (2) සාක්ෂරතාව ප්‍රබල වීමයි.
(3) නිදහස් මාධ්‍ය භාවිතයයි. (4) අධිපතිවාදී මාධ්‍ය ප්‍රවණතාවයි.
(5) මුද්‍රණ කටයුතු පහසු වීමයි.

**5.** සාමාන්‍ය ජීවිතයේ දී පුද්ගලයෙකුගේ සන්නිවේදන ධාරිතාවෙන් වැඩි ප්‍රමාණයක් වැය වන්නේ,
(1) ශ්‍රවණයට ය. (2) කථනයට ය.
(3) පාඨනයට ය. (4) ලේඛනයට ය.
(5) රූපණයට ය.

**6.** අවාචික සන්නිවේදයේ ලක්ෂණයක් **නොවන්නේ**,
(1) අඛණ්ඩ ක්‍රියාවලියක් වීමයි. (2) පුද්ගලබද්ධතාවෙන් තොර වීමයි.
(3) විවිධ ක්‍රම යොදාගත හැකි වීමයි. (4) අචේතනිකව ද සිදු වීමයි.
(5) පොදු රීතියක් නොමැති වීමයි.

**7.** සංවර්ධන සන්නිවේදනය සඳහා පූජකතුමා, වෙද මහතා සහ සංවර්ධන නිලධාරි මහතා හවුල්කර ගැනීම මගින් පැහැදිලි වන්නේ,
(1) සහභාගිත්ව ප්‍රවේශයයි. (2) පුද්ගල ප්‍රතිරූපයයි.
(3) ප්‍රජා මාධ්‍ය ප්‍රවේශයයි. (4) දෙපියවර සංකල්පයයි.
(5) ග්‍රාහක කේන්ද්‍රීය ප්‍රවේශයයි.

**08.** වෙරළබඩ ගම්මානයක ජනතාවට සුනාමි අනතුරක දී ඉතා ඉක්මනින් හා පුළුල් ලෙස අනතුරු ඇඟවීමක් කළ හැකි වන්නේ,

(1) ලිඛිත සන්නිවේදනයෙනි. (2) දෘශ්‍ය සන්නිවේදනයෙනි.
(3) ශ්‍රව්‍ය සන්නිවේදනයෙනි. (4) ශ්‍රව්‍ය-දෘශ්‍ය සන්නිවේදනයෙනි.
(5) ලිඛිත-දෘශ්‍ය සන්නිවේදනයෙනි.

**09.** කෙටිකාලීන මතකයේ ඇති කරුණු දිගුකාලීන මතකය කරා රැගෙන යාමට බලපාන ප්‍රධාන සාධකයක් **නොවන්නේ,**

(1) අවධාරණයයි. (2) භාවිතයයි.
(3) ආවර්ජනයයි. (4) පරිකල්පනයයි.
(5) අභ්‍යාසයයි.

**10.** නිර්මාණකරුවෙකුට තම නිර්මාණ ජනතාවට හැඟෙන පරිදි ඉදිරිපත් කළ හැකි වන්නේ,

(1) භාෂාත්මක අවබෝධයෙනි. (2) තේමාව ගැන අවබෝධයෙනි.
(3) සහවේදනයෙනි. (4) සංජානන ශක්තියෙනි.
(5) ජනවිඥානය ගැන අවබෝධයෙනි.

**11.** පාසලේ ගුරු මණ්ඩලය ඔවුනොවුන් අතර සහයෝගිතාව පවත්වා ගනිමින් කණ්ඩායම් හැඟීමකින් යුක්ත ව වෙහෙස නො බලා කටයුතු කිරීමෙන් පාසලේ විභාග ප්‍රතිඵල වාර්තාගත ලෙස ඉහළ දැමීමට සමත් වූහ. ඔවුන්ගේ සාර්ථකත්වය පිටුපස ඇත්තේ,

(1) වගකීමයි. (2) වගවීමයි.
(3) යුතුකමයි. (4) සුහදත්වයයි.
(5) සහානුභූතියයි.

**12.** අරමුණු, වගවීම හා සුසංයෝගය වැනි කරුණු පිළිබඳ ව සංසන්දනාත්මක ව සලකා බලන විට වඩාත් ම වගකීම් සහිත සන්නිවේදන ප්‍රභේදය කුමක් ද?

(1) සමූහ සන්නිවේදනය (2) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය
(3) පුද්ගලාන්තර සන්නිවේදනය (4) ජන සන්නිවේදනය
(5) මහජන සන්නිවේදනය

**13.** සන්නිවේදන ක්ෂේත්‍රය වෙළෙඳපොළ රීතීන්ට අනුව සකස් විය යුතුය යන අදහස මුලින් ම අවධාරණය කරන ලද්දේ,

(1) අධිපතිවාදී සන්නිවේදන සංකල්පය මගිනි.
(2) නිදහස් මතවාදී සන්නිවේදන සංකල්පය මගිනි.
(3) සමාජ ප්‍රජාතන්ත්‍රිකරණ සන්නිවේදන සංකල්පය මගිනි.
(4) සෝවියට් කොමියුනිස්ට්වාදී සන්නිවේදන සංකල්පය මගිනි.
(5) සමාජ වගකීම් සන්නිවේදන සංකල්පය මගිනි.

**14.** සන්නිවේදනය යන සංකල්පයේ මූලික ම අර්ථය වන්නේ,

(1) තොරතුරු හුවමාරු කර ගැනීම ය.
(2) සන්දේශ සම්ප්‍රේෂණය කිරීම ය.
(3) පුද්ගල අන්තර් ක්‍රියාකාරිත්වය ය.
(4) යම් දෙයක් තවත් කෙනෙකුට දැනුම් දීම ය.
(5) හුදකලා වූ පාර්ශ්ව අතර සම්බන්ධතා ඇති කිරීම ය.

**15.** ජන ඇදහිලි පිළිබඳ විමර්ශනය කිරීමේ දී පහත සඳහන් ප්‍රකාශවලින් **අසත්‍ය** වන්නේ,

(1) සමාජ යථාර්ථයෙන් යුක්ත වීම ය.
(2) සමාජ පැවැත්මට අවශ්‍ය බව සැලකීම ය.
(3) ආගම්වලින් බැහැර ව නොපැවතීම ය.
(4) නැගෙනහිර රටවල බහුල ව පැවතීම ය.
(5) විශ්වාසයෙන් බැහැර ව නොපැවතීම ය.

**16.** ශ්‍රී ලංකාවේ අභිගුණ්ඨික ජන කණ්ඩායම් ලාංකේය සංස්කෘතික සම්ප්‍රදායයන් අවශෝෂණය කරගෙන ඇති බවක් දක්නට ලැබේ. මෙය,

(1) සංස්කෘතික විසරණයකි. (2) සංස්කෘතික ත්වරණයකි.
(3) සංස්කෘතික කම්පනයකි. (4) සංස්කෘතික ලැග්මකි.
(5) පාරසංස්කෘතිකකරණයකි.

**17.** සංවර්ධන සන්දේශ ප්‍රවර්ධන කාර්යයේ ලක්ෂණයක් **නොවන්නේ,**

(1) විශේෂඥ නියාමනයක් අවශ්‍ය වීමයි.
(2) සැලැස්ම පිළිබඳ සෑම දෙයක්ම දැන සිටීමයි.
(3) කාල රාමුවක් රහිත ව ක්‍රියා කිරීමයි.
(4) ග්‍රාහක ප්‍රතිචාර ලබා ගැනීමට කටයුතු කිරීමයි.
(5) තක්සේරු කිරීමේ වැඩපිළිවෙළක් පැවතීමයි.

**18.** "ඔබගේ ප්‍රකාශනයේ ව්‍යුහාත්මක ලක්ෂණ විශද වන්නේ ප්‍රගල්භ වූ විදග්ධ ජනයාට ය"
ඉහත වාක්‍යය ගුරුවරයකු විසින් පස්වන ශ්‍රේණියේ සිසුන්ට ලබා දී තිබුණි. සන්නිවේදන විෂය අනුව මෙය හැඳින්විය හැක්කේ,

(1) ගැඹුරු වාක්‍යයක් ලෙසට ය. (2) වාක්‍ය වින්‍යාස දෝෂයක් ලෙසට ය.
(3) අර්ථ බාධකයක් ලෙසට ය. (4) ශාස්ත්‍රීය ප්‍රකාශනයක් ලෙසට ය.
(5) අත්දැකීම් පසුතලයේ දෝෂයක් ලෙසට ය.

**19.** ජනශ්‍රැතිය පොතපතින් නො ව මුඛ පරම්පරාවෙන් පැවත එන බව පැහැදිලි ලෙස පෙන්වා දෙන ලද පළමු ශ්‍රී ලාංකේය විද්වතා වන්නේ,

(1) මාර්ටින් වික්‍රමසිංහ ය. (2) ආනන්ද කුමාරස්වාමි ය.
(3) නන්දසේන රත්නපාල ය. (4) රැල්ෆ් පීරිස් ය.
(5) කාර්තිකේසු සිවතම්බි ය.

**20.** මාධ්‍ය සාක්ෂරතාව මගින් මූලික ව ම ප්‍රවර්ධනය කිරීමට උත්සාහ කරන්නේ කුමක් ද?

(1) සන්දේශ විචාරය කිරීමේ හැකියාව
(2) සන්දේශ නිර්මාණය කිරීමේ හැකියාව
(3) සන්දේශ විනිශ්චය කිරීමේ හැකියාව
(4) සන්දේශ ග්‍රහණය කිරීමේ හැකියාව
(5) සන්දේශ අර්ථකථනය කිරීමේ හැකියාව

**21.** පහත දැක්වෙන ප්‍රකාශ සලකා බලන්න.

A - සංවර්ධනයේ පදනම ජනමාධ්‍ය බැවින් ඒවා සැලසුම් සහගත ව භාවිත කළ යුතු ය.
B - සමාජයේ සෑම ඓතිහාසික වෙනස්වීමක් ම පන්ති අරගලයේ බලපෑමට හසු වී ඇත.
C - කාර්මික සංවර්ධනය සමග කම්කරු ශ්‍රමික පන්තියක් බිහි විය.
D - නව ව්‍යාපාරික පන්තිය ගොවි කම්කරු ජනතාව පීඩාවට පත් කරයි.

ඉහත ප්‍රකාශ අතුරෙන් සමාජ විග්‍රහය පිළිබඳ මාක්ස්වාදී ප්‍රවේශයට අනුව නිවැරදි වන්නේ

(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) C හා D පමණි.
(4) A, B හා C පමණි. (5) B, C හා D පමණි.

**22.** විවිධ සේවා සමූපකාර සමිති ක්‍රමයේ දී විවිධ සේවා යන්නට අයත් වනුයේ,

(1) සලාක ලබා දීම, සහනාධාර ලබා දීම, නිෂ්පාදන සිදු කිරීම හා භාණ්ඩ අලෙවි කිරීම ය.
(2) සැලසුම් කිරීම, කාර්ය බෙදා ගැනීම, වැඩ කිරීම හා නියාමනය ය.
(3) නිෂ්පාදිතය, මිල, ස්ථානය හා ප්‍රවර්ධනය ය.
(4) නිෂ්පාදනය, ප්‍රවර්ධනය, ප්‍රචාරණය හා අලෙවිය ය.
(5) නිෂ්පාදනය, අලෙවිය, බෙදාහැරීම හා මිලදී ගැනීම ය.

**23.** සන්දේශයක් නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීමේ දී සැලකිල්ල දැක්විය යුතු ක්‍රමෝපායක් වශයෙන් ගත **නොහැක්කේ,**

(1) ග්‍රාහකයාට පහසුවෙන් සංජානනය කළ හැකි වීමයි.
(2) ග්‍රාහකයාගේ මානසික උද්දීපනයක් ඇති කිරීමට හැකි වීමයි.
(3) ග්‍රාහකයාට හුරුපුරුදු ආකෘතියක් භාවිත කිරීමයි.
(4) ග්‍රාහකයාට ප්‍රීතිය හා ජීවිතාවබෝධය ලබා දීමයි.
(5) ග්‍රාහකයාගේ සාක්ෂරතා හැකියාව සමග ගැළපීමයි.

**24.** නිර්මාණකරුවෙකුට සිය ස්වීයත්වය පවත්වා ගැනීම වඩාත් පහසු වන්නේ,
(1) කවි ගායනයේ දී ය. (2) චිත්‍රකරණයේ දී ය.
(3) සිනමා නිර්මාණකරණයේ දී ය. (4) වේදිකා නාට්‍යයේ දී ය.
(5) රූපවාහිනී මාලා නාට්‍යයක දී ය.

**25.** නිදහස් මතවාදී සන්නිවේදන සංකල්පය සංවර්ධනය කිරීමට දායක වූ චින්තකයන් පමණක් ඇතුළත් වන වරණය තෝරන්න.
(1) ජෝන් බෙන්තම්, ජෝන් ලොක්, ජෝන් මිල්ටන්, ජෝන් ස්ටුවර්ට් මිල්
(2) ජෝන් මිල්ටන්, ජෝන් ස්ටුවර්ට් මිල්, නිකොලායි මැකියාවෙලි, කාල් මාක්ස්
(3) නිකොලායි මැකියාවෙලි, ජෝන් ලොක්, ජෝන් මිල්ටන්, තෝමස් හොබ්ස්
(4) ජෝන් ලොක්, ජෝන් මිල්ටන්, ජෝන් ස්ටුවර්ට් මිල්, ෆෙඩ්රික් හේගල්
(5) තෝමස් හොබ්ස්, ඇඩම් ස්මිත්, ෆෙඩ්රික් හේගල්, ජෝර්ජ් ගර්බ්නර්

**26.** **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) මානසික පීඩාව යනු අන්තර්වර්ති පුද්ගල සන්නිවේදන ලක්ෂණයකි.
(2) හිතමිතුරන් අහිමිවීම නිසා ක්ලමථය ඇති විය හැකි ය.
(3) තමා මෙන් ම අනෙකා ද නිවැරදිය සිතීම හඳුන්වන්නේ ධ්‍රැවගත වීම ලෙස ය.
(4) අධික ලෙස ආහාර ගැනීමේ පුරුද්ද කාංසාවේ ලක්ෂණයකි.
(5) තම වැඩවල ඉලක්ක සපුරා ගත නොහැකි වීමෙන් ආතතිය ඇති විය හැකි ය.

**27.** භාෂා භාවිතය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහතින් දැක්වේ.
A - ආත්ම ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ හැකියාව.
B - පුද්ගල බද්ධ සංසිද්ධියක් වීම.
C - පෞද්ගලික දෘෂ්ටිකෝණයක් අවශ්‍ය වීම.
ඉහත ප්‍රකාශවලට අනුරූප භාෂා භාවිත ප්‍රභේද අනුපිළිවෙළින් දැක්වෙන වරණය කුමක්ද?
(1) භාෂණය, විවරණය, ලේඛනය (2) රූපණය, ලේඛනය, විවරණය
(3) කථනය, රූපණය, භාෂණය (4) භාෂණය, රූපණය, විවරණය
(5) ලේඛනය, භාෂණය, කථනය

**28.** ලෝකයේ විවිධ ජන වර්ග සහ ජාතීන්ගේ ආධ්‍යාත්මික සංස්කෘතියට පමණක් අයත් කරුණු අඩංගු වන වරණය කුමක් ද?
(1) ආගම, කලාව, පුරාණෝක්තිය, දේශපාලනය
(2) ආර්ථිකය, තාක්ෂණය, විද්‍යාව, කලාව
(3) කලාව, ආගම, දර්ශනය, පුරාණෝක්තිය
(4) දර්ශනය, පුරාවිද්‍යාව, කලාව, ආගම
(5) ආර්ථිකය, පුරාවිද්‍යාව, පුරාණෝක්තිය, විද්‍යාව

**29.** ගෝලීයකරණ ක්‍රියාවලියේ පූර්ව කොන්දේසියක් වන්නේ,
(1) තාක්ෂණික ක්‍රියාවලිය ප්‍රතික්ෂේප කිරීම ය.
(2) පවුල සහ ජාතික වටිනාකම්වලට ප්‍රමුඛත්වය දීම ය.
(3) වාර්ගික සංවෘත්තභාවය ය.
(4) උපරි ජාතික ආයතන නිර්මාණය කිරීම ය.
(5) සන්නිවේදන ක්‍රියාවලියේ ව්‍යාප්තිය ය.

**30.** භාෂා සංස්කෘතියට අයත් **නොවන්නේ**,
(1) උත්සව අවස්ථාවලට අදාළ කටයුතු ය.
(2) දාර්ශනික පඨිත නිර්මාණය සහ පාඨනය ය.
(3) මිනිසා සම්බන්ධයෙන් පරිබාහිර ස්වභාවික වස්තු ය.
(4) මානව සමාජ චර්යාවලට අදාළ ක්‍රියාකාරකම් ය.
(5) ආත්මකථනය හා සම්බන්ධ සන්නිවේදන ක්‍රියා ය.

**31.** පොලිස් මහජන සම්බන්ධතා සහ අපරාධ වැළැක්වීමේ කාර්යාංශයට අයත් කාර්යයන් පිළිබඳ ව මතු වූ අදහස් කිහිපයක් පහත දැක්වේ.

A - පාසල් සිසුන් දැනුවත් කිරීමට දේශන පැවැත් වීම.
B - ආගමික උත්සවවලදී මහජනයාට පිහිට වීම.
C - අපරාධකරුවන්හට දඬුවම් නියම කිරීම.
D - ජනමාධ්‍ය සඳහා අදාළ වැඩසටහන් සංවිධානය කිරීම.

මේ අතුරෙන් ඔවුනට වඩාත් ගැළපෙන කාර්යයන් වන්නේ,

(1) A හා B ය. (2) B හා C ය. (3) C හා D ය. (4) A, B සහ D ය. (5) B, C හා D ය.

**32.** සමාජයෙන් සන්නිවේදනයටත්, සන්නිවේදනයෙන් සමාජයටත් අන්‍යෝන්‍ය වශයෙන් බලපෑම් සිදු කරනු ලබන ප්‍රබල සාධකය කුමක් ද?

(1) දේශපාලනික සාධකයයි (2) පාරිසරික සාධකයයි
(3) නිර්මාණාත්මක සාධකයයි (4) ආර්ථික සාධකයයි
(5) තාක්ෂණික සාධකයයි

**33.** මාධ්‍ය මගින් ප්‍රචණ්ඩත්වයට බර වූ වැඩසටහන් ඉදිරිපත් කිරීම තුළින් සිදු වන සමාජ බලපෑම පිළිබඳ පන්ති කාමරයේ දී සිසුන් අතර සංවාදයක් ඇති විය.

රහීම් :- ඒ වගේ වැඩසටහන් බලන්න සමහරු කැමතියි
රමල් :- ළමයින්ගේ ජීවිතවලට තදින් බලපාන්න පුළුවන්
කමනී :- සමහර විට ප්‍රචණ්ඩත්වය අඩු වෙන්නත් පුළුවන්
රමනී :- පවුල් අතර නැති ප්‍රශ්නත් ඇති වෙනවා

මේ අදහස් අතුරෙන් පිළිගත හැකි අදහස් ඉදිරිපත් කරන්නේ,

(1) රහීම්, රමල් සහ කමනී පමණි. (2) රමල්, කමනී සහ රමනී පමණි.
(3) රහීම්, කමනී සහ රමනී පමණි. (4) රහීම්, රමල් සහ රමනී පමණි.
(5) රහීම්, රමල්, කමනී සහ රමනී යන සියලු දෙනාම ය.

**34.** මාධ්‍ය දැන්වීම්කරණය පිළිබඳ ව වූ විවාදයක දී ඉස්මතු වූ කරුණුවලට අනුව එය,

A - සමාජීය අවශ්‍යතාවකි.
B - සමාජයට යහපතක් සිදු කරයි.
C - සමාජයට අයහපතක් සිදු කරයි.
D - සමාජ මත වෙනස් කරයි.

මේ අදහස්වලින්,

(1) A, B හා C පමණක් නිවැරදි වේ.
(2) A, B හා D පමණක් නිවැරදි වේ.
(3) A, C හා D පමණක් නිවැරදි වේ.
(4) B, C හා D පමණක් නිවැරදි වේ.
(5) A, B, C හා D සියල්ලම නිවැරදි වේ.

**35.** “තමන් කැමති දෙයක් කිව නොහැකි තැනක ඔහුට කිසිවක් අයිති වන්නේ ද නැත” ග්‍රීක දාර්ශනික ප්ලේටෝගේ (Plato) මේ ප්‍රකාශයෙන් කියවෙන්නේ,

(1) විසම්මුතියෙහි වටිනාකමයි. (2) නිදහස් මතවාදයේ වැදගත්කමයි.
(3) සහෝදරත්වයේ අවශ්‍යතාවයි. (4) සහවේදනයේ ලක්ෂණයයි.
(5) වාර්ගික සහජීවනයයි.

**36.** යම්කිසි භාෂාවක් මළ භාෂාවක් බවට පත් වීම නිසා ඇති විය හැකි බරපතළ තත්ත්වයන් පිළිබඳ ව අදහස් කිහිපයක් පහතින් දැක්වේ.

A - අදාළ ප්‍රජාවට අදහස් හුවමාරු කර ගැනීම සඳහා පවතින අවස්ථා අහිමි වේ.
B - අදාළ ප්‍රජාවේ සංස්කෘතික අනන්‍යතාව පවත්වා ගැනීමේ හැකියා ගිලිහේ.
C - අදාළ භාෂාව තුළ සඳහන් ව තිබූ දැනුම් සම්භාරය අහෝසි වේ.
D - අදාළ ප්‍රජාවන්ට ජාතියක් හෝ ජනවර්ගයක් ලෙස තිබූ පිළිගැනීම අහෝසි වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,

(1) A, B හා C පමණි. (2) A, B හා D පමණි.
(3) A, C හා D පමණි. (4) B, C හා D පමණි.
(5) A, B, C හා D සියල්ලම ය.

**37.** මානව ගුණධර්ම තේමා කරගනිමින් නිපදවා තිබූ වෘත්තාන්ත චිත්‍රපටයක් පිළිබඳ ව පුවත්පත් හා සඟරා කිහිපයක විචාර ලිපි පළවී තිබුණි. එක් පුවත්පතක පළවූ ලිපියක අඩංගු වූයේ කලාත්මක පැතිකඩ හා අභ්‍යන්තර ලක්ෂණ ඇතුළත් වූ විචාරයකි. මෙහිදී විචාරකයා භාවිත කළ විචාර ක්‍රමය කුමක් ද?
(1) සෞන්දර්යාත්මක විචාර ක්‍රමය
(2) සදාචාරාත්මක විචාර ක්‍රමය
(3) දේශපාලනික විචාර ක්‍රමය
(4) සංසන්දනාත්මක විචාර ක්‍රමය
(5) භාෂාත්මක විචාර ක්‍රමය

- අංක **38** සිට **40** තෙක් ප්‍රශ්නවලට පහත දැක්වෙන සටහන ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| | | | |
|---|---|---|---|
| A | ප්‍රජාතනය | G | චරකය |
| B | නවෝත්පාදන විසරණය | H | මුඩුක්කු |
| C | මන්දපෝෂණය | I | පුරවැසියන් බලගැන්වීම |
| D | ප්‍රාමාණිකරණය | J | ස්වරාජ් |
| E | නූගත්කම | K | විරැකියාව |
| F | ස්වයං විශ්වාසය | L | අන්තර් පුද්ගල විශ්වාසය |

**38.** ඉහත සටහන අතුරෙන් පෝල් පී ස්ට්‍රීවන්ගේ නිර්වචනයට අයත් අංග වන්නේ,
(1) A, C, D හා J ය.
(2) C, E, H හා K ය.
(3) C, H, E හා L ය.
(4) C, K, E හා G ය.
(5) E, D, B හා H ය.

**39.** නායර් හා වයිට් සංවර්ධන සන්නිවේදන මාදිලියට අයත් සංකල්පවලට අදාළ වන්නේ,
(1) B, F හා D ය.
(2) D, I හා L ය.
(3) F, I හා L ය.
(4) I, J හා F ය.
(5) L, G හා A ය.

**40.** සංවර්ධනය පිළිබඳ චීන ආකෘතියට සහ මහත්මා ගාන්ධිතුමාගේ සන්නිවේදන භාවිතයට පිළිවෙළින් අයත් කාණ්ඩය වන්නේ,
(1) AB හා GI ය.
(2) AD හා GJ ය.
(3) AF හා GK ය.
(4) BD හා GJ ය.
(5) CD හා JL ය.

**41.** චිත්‍රපටයක එන දර්ශනාවලියක පළමු රූපයෙන් පුද්ගලයකුගේ මිය යෑම නිරූපණය කෙරේ. දෙවන රූපයෙන් ගං තෙරක සිටින කුරුල්ලන් පියඹා යන දර්ශනයක් වෙත සෘජුව ම ඡේදනය වේ.
මෙය නැරඹූ පියල් එම ජවනිකාවෙන් නිරූපණය වූ කිසිවක් ඔහුට වැටහී නොගිය බව පැවසී ය. ඒ සඳහා හේතු වන්නට ඇත්තේ,
(1) පියල්ට චිත්‍රපටයේ සංඥාර්ථ නිසි ලෙස කියවා ගැනීමට නොහැකි වීමයි.
(2) පියල්ට චිත්‍රපට මාධ්‍ය සංස්කෘතිය පිළිබඳ නිසි අවබෝධයක් නොතිබීමයි.
(3) පියල් සිටි ස්ථානයට චිත්‍රපටය මැනවින් දර්ශනය නොවීමයි.
(4) පියල්ට සාක්ෂරතා ඥානය නොමැති වීමයි.
(5) පියල්ට එම චිත්‍රපටයේ රූප අපැහැදිලි වීමයි.

**42.** පහත සඳහන් ප්‍රකාශයන්ගෙන් මාධ්‍ය කර්මාන්තය සම්බන්ධයෙන් **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?
(1) වඩාත් සංවිධානාත්මක ව ව්‍යුහයක් තුළ ක්‍රියාත්මක වීම
(2) වෙළෙඳපොළ අවශ්‍යතා මුල් කර ගනිමින් කටයුතු කිරීම
(3) පාර්ශ්ව ගණනාවක් එකතු ව සන්දේශ නිෂ්පාදනය කිරීම
(4) මාධ්‍ය ආයතන අතර තරගකාරිත්වයක් පැවතීම
(5) සැමවිට ම සමාජීය මනස ව්‍යාපාරික ආධිපත්‍යයෙන් ගළවා ගැනීම

[ පස්වැනි පිටුව බලන්න

**43.** පුවත්පතක සංස්කාරකවරයෙකුට ලැබුණු අත්පිටපතක අක්ෂර වින්‍යාසය හා ව්‍යාකරණ දෝෂ සහිත වාක්‍ය කිහිපයක් දක්නට ලැබුණි. එහි සඳහන් ව තිබූ නිවැරදි වාක්‍යය කුමක් ද?

(1) උපාධි ප්‍රධානෝත්සවයට මම සහභාගි වුනෙමි.
(2) තාත්තා ද අම්මා ද මම ද උත්සවයට ගියහ.
(3) දෙවියෝ වැනි මිනිස්සු අපි අතර වෙති.
(4) සඟරාව මුද්‍රණ ද්වාරයෙන් පිටවීම ගැන පාඨකයෝ සතුටු වූහ.
(5) කෙනෙක් එදින උත්සවයට නො පැමිණියහ.

**44.** පහත දැක්වෙන ප්‍රකාශ සලකා බලන්න.

A - ඔබ කියන දෙය පැහැදිලි ය.
B - මම දන්න භාෂාවකින් තමයි කියන්නේ.
C - ඒ කාරණය ඉතා වටිනා එකක්.
D - අනෙක් අයගේ සහයෝගයෙන් එය ආරම්භ කරමු.

එම ප්‍රකාශවලට අනුරූප වන ශ්‍රවණ ක්‍රියාවලියේ අවස්ථා අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) තේරුම් ගැනීම, ශ්‍රවණය, ඇගයීම, ප්‍රතික්‍රියාව
(2) ශ්‍රවණය, තේරුම් ගැනීම, ප්‍රතික්‍රියාව, ඇගයීම
(3) තේරුම් ගැනීම, ප්‍රතික්‍රියාව, ඇගයීම, ශ්‍රවණය
(4) ශ්‍රවණය, ඇගයීම, තේරුම් ගැනීම, ප්‍රතික්‍රියාව
(5) ශ්‍රවණය, තේරුම් ගැනීම, ඇගයීම, ප්‍රතික්‍රියාව

**45.** පහත සඳහන් ප්‍රකාශ අතරින් **සදොස්** ප්‍රකාශය තෝරන්න.

(1) වාචික සන්නිවේදනය බොහෝ අවස්ථාවල සිදුවන්නේ අවාචික සංඥා සම්මිශ්‍ර ව ය.
(2) අපූර්වත්වය සහ වින්දනාත්මක බව නිර්මාණාත්මක සන්නිවේදනයේ විශේෂත්වයකි.
(3) සමාජයක බලකේන්ද්‍රීය ස්වභාවය සන්නිවේදනයේ ක්‍රියාකාරීත්වයට බලපෑමක් එල්ල නො කරයි.
(4) දුගීභාවයේ සංස්කෘතියෙන් ප්‍රජාව මුදවා ගැනීම සංවර්ධන සන්නිවේදනයේ ඇති අභියෝගයකි.
(5) ස්වදේශිකත්ව ඥානය ගොනු වී ඇති ප්‍රබල සන්නිවේදන ක්‍රමයක් ලෙස සිරිත් විරිත් හැඳින්විය හැකි ය.

**46.** වියුක්තිකරණය හෙවත් විභේදනය අත්‍යවශ්‍ය අන්තර්වර්ති පුද්ගල සන්නිවේදන කාර්යයක් ලෙස සැලකිය හැකි වන්නේ,

(1) පංචවිධ සංවේදන අවධානයට ලක් කිරීම සඳහා ය.
(2) සහානුභූතිය අත්පත් කර ගැනීම සඳහා ය.
(3) පංචවිධ සංවේදන වෙන් කර හඳුනා ගැනීම සඳහා ය.
(4) සාර්ථක සංජානනයක් සඳහා ය.
(5) සංකල්ප සුවිශේෂ ලෙස ගොඩනගා ගැනීම සඳහා ය.

**47.** පුරාතන සමාජයේ දෝලාවෙන් ගමන් කිරීමේ සිට නූතන සමාජයේ මෝටර් රථයෙන් ගමන් කිරීම තෙක් සිදු වූ සමාජ විපරිවර්තනය,

(1) සංස්කෘතික කම්පනයකි.
(2) සංස්කෘතික විසරණයකි.
(3) සංස්කෘතික ලැග්මකි.
(4) සංස්කෘතික ත්වරණයකි.
(5) සංස්කෘතික බාදනයකි.

**48.** ස්වදේශීය ඥාන පද්ධතිය ස්මරණය කර ගැනීම සහ සංරක්ෂණය කරගැනීම සඳහා පුරාතන පඬිවරුන් බහුල වශයෙන් භාවිත කළ ක්‍රමවේදය වූයේ, ඒවා

(1) නිර්මාණාත්මක ප්‍රකාශන බවට පත් කිරීම ය.
(2) චිත්ත සිතුවම් බවට පරිවර්තනය කිරීම ය.
(3) සාරාංශ කර ස්මරණයෙහි තබා ගැනීම ය.
(4) ඛණ්ඩනය කොට ග්‍රන්ථකරණය කිරීම ය.
(5) තාර්කික රටාවන්ට අනුව පෙළ ගැස්වීම ය.

**49.** සිය ඉල්ලීම් දිනා ගැනීම සඳහා දිගු කාලයක් ඉල්ලීම් කර එය අසාර්ථක වූ පසු පුද්ගලයෙකු ඊට විරෝධය පෑම සඳහා ප්‍රසිද්ධියේ රජයේ ගොඩනැගිල්ලක වහලය මත මාරාන්තික උපවාසයක් ආරම්භ කරන බවට රූපවාහිනී මාධ්‍යවේදියෙකුට දැනගන්නට ලැබිණ. සමාජ හිතකාමී පුවත් සෙවීම තම වගකීම කර ගත් මාධ්‍යවේදියකු ලෙස ඔහු/ඇය මෙහි දී කළ යුතුව තිබුණේ කුමක් ද?

(1) අදාළ පුද්ගලයා පිළිබඳ ව පොලිසියට දැනුම් දී සිද්ධියට පෙර ඔහු අත්අඩංගුවට ගැනීමට කටයුතු කිරීම.
(2) මාරාන්තික උපවාසයට තැත් කිරීමේ උත්සාහය වළකාලමින් ඔහුගේ ඉල්ලීම් සඳහා මාධ්‍ය මගින් හඬක් නිර්මාණය කිරීම.
(3) සිදුවීම උපරිම ලෙස ආවරණය කර වහා මාධ්‍ය වෙත උණුසුම් පුවත් ලබා දීමට අදහස් කිරීම
(4) වෙනත් මාධ්‍ය ආයතන වාර්තාකරුවන් උපක්‍රමික ව වළක්වා වාර්තාකරණයේ ප්‍රමුඛයා බවට පත්වීමට කටයුතු කිරීම.
(5) බලධාරීන් කළ වරද ඉස්මතු කිරීම සඳහා මාරාන්තික උපවාසයේ යෙදීමට තැත් කළ පුද්ගලයාගේ ප්‍රකාශනයක් රූගත කර ගැනීමට උනන්දු වීම.

**50.** මාධ්‍ය හා ගෝලීයකරණය පිළිබඳ ව පාසල් මාධ්‍ය සමාජයක පවත්වන ලද සාකච්ඡාවක දී උසස් පෙළ සිසුන් කිහිපදෙනකු ඉදිරිපත් කළ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

මධූෂි :- ගෝලීයකරණයේ ව්‍යාප්තියට මාධ්‍ය පිටිවහලක් වුනා
රේණුකා :- වාණිජ කර්මාන්තයේ කාලීන අවශ්‍යතාවක් ලෙසට මාධ්‍ය සංස්කෘතිය හඳුන්වන්න පුළුවන්
මේනකා :- ජනමාධ්‍ය සංස්කෘතියෙන් සංතෘප්ත කරන ජනතාවට එහි බලපෑම ගැන දැනුවත්කමක් නැහැ
ප්‍රබෝධනී :- මාධ්‍ය සිය වෙළෙඳපොළ ව්‍යාප්ත කිරීම සඳහා සාම්ප්‍රදායික අදහස් උපයෝගී කර ගන්නේ නැහැ

ඉහත ප්‍රකාශ අතුරෙන්,

(1) මධූෂි, රේණුකා හා මේනකාගේ ප්‍රකාශ පමණක් නිවැරදි වේ.
(2) රේණුකා, මේනකා හා ප්‍රබෝධනීගේ ප්‍රකාශ පමණක් නිවැරදි වේ.
(3) මධූෂි, මේනකා හා ප්‍රබෝධනීගේ ප්‍රකාශ පමණක් නිවැරදි වේ.
(4) මධූෂි, රේණුකා හා ප්‍රබෝධනීගේ ප්‍රකාශ පමණක් නිවැරදි වේ.
(5) මධූෂි, රේණුකා, මේනකා හා ප්‍රබෝධනී යන සියලු දෙනාගේ ම ප්‍රකාශ නිවැරදි වේ.

* * *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2019

නව/ පැරණි නිර්දේශය/ புதிய/ பழைய பாடத்திட்டம

| විෂය අංකය<br>பாட இலக்கம் | 29 | විෂයය<br>பாடம் | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය |
|---|---|---|---|

ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 2 | 21. | 5 | 31. | 4 | 41. | 1 |
| 02. | 1 | 12. | 1 | 22. | 5 | 32. | 3 | 42. | 5 |
| 03. | 3 | 13. | 2 | 23. | 4 | 33. | 5 | 43. | 5 |
| 04. | 4 | 14. | 5 | 24. | 2 | 34. | 5 | 44. | 5 |
| 05. | 1 | 15. | 3 | 25. | 1 | 35. | 2 | 45. | 3 |
| 06. | 2 | 16. | 1 | 26. | 3 | 36. | 4 | 46. | 5 |
| 07. | 4 | 17. | 3 | 27. | 4 | 37. | 1 | 47. | 4 |
| 08. | 3 | 18. | 3 | 28. | 3 | 38. | 2 | 48. | 1 |
| 09. | 4 | 19. | 2 | 29. | 4 | 39. | 3 | 49. | 2 |
| 10. | 5 | 20. | 4 | 30. | 3 | 40. | 2 | 50. | 1 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 02 ලකුණු බැගින්/புள்ளி வீதம்
මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 50 = 100

**1.** සන්නිවේදන විෂය ක්ෂේත්‍රයේ සංකීර්ණත්වය සන්නිවේදන ආකෘතිවලින් පැහැදිලි වේ.

(i) මුල් කාලීන සන්නිවේදන ආකෘති අතර දක්නට නොලැබෙන හැරල්ඩ් ඩී. ලැස්වෙල්ගේ ආකෘතියෙහි දැකිය හැකි සුවිශේෂී මූලිකාංගය නම් කොට ඒ පිළිබඳ ව කෙටි හැඳින්වීමක් කරන්න.

- **බලපෑම**

සන්නිවේදකයා ග්‍රාහකයා වෙතින් අපේක්ෂා කරන ආකල්පමය හෝ චර්යාමය වෙනසයි.


| | | | |
|---|---|---|---|
| **නම් කිරීම** | - | **ලකුණු** | 1 |
| **විස්තර කිරීම** | - | **ලකුණු** | 1 |
| **මුළු ලකුණු** | = | | 2 |

(ii) ඔස්ගුඩ් සහ ශ්‍රාම් ඉදිරිපත් කළ ආකෘතියට අනුව විකේතිකරය, ආකේතිකරය බවට පත්වීමට හේතු වන සාධකය නම් කොට එහි ඇති වැදගත්කම පිළිබඳ ව පැහැදිලි කරන්න.

- **අර්ථකථනය/අර්ථනිරූපණය/අර්ථවිවරණය.**
  - පණිවිඩයක් තුළ පවතින අන්තර්ගත කරුණු මනාව පැහැදිලි කර ගැනීම.
  - සන්නිවේදනය අඛණ්ඩ ක්‍රියාවලියක් බවට පත් වීම.
  - සන්නිවේදකයා ග්‍රාහකයා බවටත්, ග්‍රාහකයා සන්නිවේදකයා බවටත් පත් වීම.
  - සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර පොදු මානසික තත්ත්වයක් ඇති වීම.

| | | | |
|---|---|---|---|
| **නම් කිරීම** | - | **ලකුණු** | 2 |
| **පැහැදිලි කිරීම** | - | **ලකුණු** | 2 |
| **මුළු ලකුණු** | = | | 4 |

(iii) දෙපියවර සන්නිවේදන ආකෘතියට අනුව තොරතුරු ගලනය වන ආකාරය රූප සටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.




Source : Katz & Lazarsfeld (1955)

**පළමු පියවර**

ජනමාධ්‍ය මගින් නිකුත් කරන සන්දේශ ජනමත නායකයන් විසින් ග්‍රහණය කර ගැනීම.

**දෙවන පියවර**

ජනමත නායකයන් විසින් ඉදිරිපත් කරනු ලබන සන්දේශය අනුගාමික ප්‍රජාව ග්‍රහණය කර ගැනීම.

**(සම්පූර්ණ ලකුණු ලබාදීම සඳහා ප්‍රමාණවත් විස්තරයක් ඇතුළත් කළ යුතුය)**

**ආකෘතිය ලකුණු** 2

**පියවර දෙක විස්තර කිරීම ලකුණු** 2x2 4

**මුළු ලකුණු** 6

(iv) සන්නිවේදන ක්‍රියාවලියේ ජීව විද්‍යාත්මක පදනම හඳුනා ගැනීමට පාදක වන බර්ලෝගේ සන්නිවේදන ආකෘතියට අයත් සාධක **හතරක්** පැහැදිලි කරන්න.

දෘකීම (Seeing)

ඇසීම (Hearing)

ස්පර්ශය (Touching)

ආඝ්‍රාණය (Smelling)

රස විඳීම (Teasting)

දෘකීම, ඇසීම, ස්පර්ශය,ආඝ්‍රාණය,රස විඳීම පිළිවෙළින් ඇසට, කනට,ශරීරයට, නාසයට සහ දිවට සම්බන්ධ වන අතර එකී පංචේන්ද්‍රිය සන්නිවේදනයේ ජීවවිද්‍යාත්මක පදනම ලෙස ක්‍රියා කරන්නේ ය. මේ අනුව දෘශ්‍ය සන්නිවේදනය, ශ්‍රව්‍ය සන්නිවේදනය, ස්පර්ශ සන්නිවේදනය, ආඝ්‍රාණ සන්නිවේදනය සහ රස සන්නිවේදනය ආදී සන්නිවේදන ස්වරූප ගොඩනැගී ඇති ආකාරය විස්තර විය යුතුය.

**(විස්තර කිරීම ලකුණු 2 x 4 = 8)**

**2.** මිනිසාගේ භාෂා භාවිතය, සංඥා සංකේත හා ජන කලාවන්ගේ ඇසුර නිර්මාණාත්මක සන්නිවේදනයට බලපා තිබේ. ජනමාධ්‍ය තුළින් ද එය ප්‍රකට වේ.

(i) පුවත්පත් මාධ්‍ය තුළ භාෂා භාවිතයේ දී දක්නට ලැබෙන දෝෂ **හතරක්** නම් කරන්න.

- අක්ෂර වින්‍යාස දෝෂ
- විරාම ලක්ෂණ දෝෂ
- ව්‍යාකරණ දෝෂ
- සංස්කරණ දෝෂ
- වැරදි වචන හා යෙදුම් භාවිත කිරීම.
- අර්ථ ව්‍යාකූල වීම
- අසම්මත වචන (නොගැලපෙන වචන)
- අතිශය සරල භාෂාවක් භාවිත කිරීම (ග්‍රාමීය,ඕලාරික)
- අතිශය විදග්ධ භාෂාව යොදා ගැනීම.
- උප භාෂා භාවිත නොකිරීම.

**(නම් කිරීම ලකුණු 1/2 x 4 =2)**

(ii) රූපවාහිනියේ ප්‍රචාරය වන කිරි පිටි දැන්වීම් මගින් පාරිභෝගිකයාට සිදු විය හැකි බලපෑම පිළිබඳව කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

- ආහාර පරිභෝජන රටාව වෙනස් වීම
- පෙලඹවීම් ඇති කිරීම.
- තාර්කිකත්වයෙන් තොරව යම් නිගමන වලට පෙලඹවීම.
- ව්‍යාජ ආකල්ප ඇති කිරීම.
- ආශාවන් අවශ්‍යතා බවට පත් කිරීම.
- ආර්ථිකයට බලපෑම් කිරීම.
- නව චින්තන රටා ඇති කිරීම.
- ආහාර හා පෝෂණය පිළිබඳ විශ්වාසයන් වෙනස් කිරීම.
- සාම්ප්‍රදායික සිරිත් විරිත් අභියෝගයට ලක් කිරීම.
- ප්‍රමිතිය පිළිබඳ ගැටලු මතුවීම.
- භාවිත කරන ආකාරය දැනගත හැකිවීම.
- නිශ්පාදනයන් සසඳා තෝරා ගැනීමට හැකිවීම.
- මිල ගණන් දැනගත හැකිවීම.

**(ලකුණු කිරීම ලකුණු 2 x 2 = 4)**

(iii) පාසල් මාධ්‍ය සමාජයකින් ඉදිරිපත් කළ හැකි නිර්මාණ ව්‍යාපෘති **හතරක්** නම් කර, එබඳු ව්‍යාපෘතිවලින් පාසලට සහ සිසු සිසුවියන්ට ලබා ගත හැකි ප්‍රයෝජන **හතරක්** පිළිබඳ ව කෙටියෙන් පැහැදිලි කරන්න.

**නිර්මාණ ව්‍යාපෘති**

- බිත්ති පුවත්පත් නිර්මාණය
- උදෑසන ගුවන්විදුලි සේවය
- පරිසර අලංකරණය
- මං සලකුණු පද්ධතියක් නිර්මාණය කිරීම.
- පුවත්පත්/සඟරා ප්‍රකාශයට පත් කිරීම.
- රසඥතාව ඉහළ නැංවීමේ  වැඩසටහන් සංවිධානය කිරීම.
- ආකල්ප වර්ධන ව්‍යාපෘති නිර්මාණය කිරීම.
- උපදේශන වැඩසටහන් සංවිධානය කිරීම.
- මාධ්‍ය දින උළෙල පැවැත්වීම.
- නායකත්වය පුහුණු ව්‍යාපෘති සිදු  කිරීම.

**(නම් කිරීම ලකුණු 1/2  x 4  =  2)**

ප්‍රයෝජන

- ප්‍රායෝගිකව සාමූහික අත්දැකීම් ලබා ගැනීමට
- සන්නිවේදන කුසලතා වර්ධනයට
- මෘදු කුසලතා වර්ධනයට
- නිර්මාණශීලීත්වය වර්ධනයට
- පාසලේ කීර්තිනාමය ප්‍රචලිත වීමට
- සාමය සහජීවන හා සංවිධාන ශක්තිය වර්ධනයට
- සමාජානුයෝජන ක්‍රියාවලියට
- නවෝත්පාදනයට
- මහජන සබඳතා ගොඩනැගීමට
- යහපත් මානසික තත්වයක් ගොඩනැගීමට
- ගුරු,සිසු,දෙමාපිය සහයෝගීතාව ඇති කිරීමට.
- පාසල් ප්‍රජාව අතර සම්බන්ධතාව වර්ධනයට

**විස්තර කිරීම     1x4= 4**
**මුළු ලකුණු     6**

(iv) දරුවන්ට අධ්‍යාපනය ලබාදීමේ දී ජනකතා යොදා ගැනීමේ වැදගත්කමට අදාළ කරුණු **හතරක්** නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

- විනෝදාස්වාදය පාදකව අධ්‍යාපනය ලබා දීම.
- නිර්මාණාත්මක චින්තනයක් ගොඩනැගීම
- පරිකල්පනය වර්ධනය කිරීම.
- නම්‍යශීලී,අවිධිමත් අධ්‍යාපනයක් ලැබීම.
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පහසු වීම
- බුද්ධි මට්ටමට ගැළපෙන ලෙස විෂය කරුණු පැහැදිලි කිරීමේ හැකියාව.
- නවීනත්වය තුළ දේශීය අනන්‍යතාවන් මතුකිරීම.
- දැනුම හා සමාජ වටිනාකම් අතර සම්බන්ධය ගොඩනැගීම.
- පරිසරය හා සංස්කෘතික උරුමයන් පිළිබඳව ආකල්ප වර්ධනය.
- තාර්කිකත්වය හා විශ්ලේෂණ හැකියා වර්ධනය.
- සංකීර්ණ කරුණු පැහැදිලි කිරීම.
- ප්‍රකාශන කුසලතාව වර්ධනය වීම.
- ස්මරණ ශක්තිය වර්ධනය.
- සවන්දීමේ කුසලතා දියුණු කිරීම.
- සමාජානුයෝජනය සඳහා

**(ලකුණු 2x4=8)**
**(නිදසුන් සහිතව විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.)**

**3.** (i) සංවර්ධන සන්නිවේදනයේ දී සාම්ප්‍රදායික මාධ්‍ය යොදා ගැනීමේ වාසි **හතරක්** නම් කරන්න.

- විශ්වසනීයත්වයෙන් යුක්ත වීම.
- ගැමි ජනතාවට බෙහෙවින් හුරු පුරුදු සංඥා හා සංකේත වලින් යුක්ත වීම.
- ගැමි සමාජය තුළ පොදු මාධ්‍යයන් බවට පත්වී තිබීම.
- ජන විඥානයට බද්ධ වී පැවතීම.
- ග්‍රාහකයන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය ලබා ගැනීමට සමත් වීම.
- ජනතාවට සමීප මාධ්‍යයක් වීම.
- අවම පිරිවැයක් සහිත වීම.
- නූතන මාධ්‍ය මෙන් ආවරණ ගැටලු නොමැති වීම.
- වින්දනාත්මක ස්වභාවය නිසා පොලඹවා ගැනීමට හැකි වීම.
- සාක්ෂරතා ඥානයක් අවශ්‍ය නොවීම.
- ගැමි ජනතාව තුළ උත්තේජනයක් ඇති කළ හැකි වීම.

**(ලකුණු 1/2x4 = 2)**

(ii) ප්‍රචණ්ඩත්වය පුවත්පත් මාධ්‍ය තුළ නිරූපණය වන ආකාර **හතරක්** දක්වා, ඉන් **එකක්** ගැන විස්තර කරන්න.

- ප්‍රවෘත්ති සඳහා යොදාගන්නා ශීර්ෂ පාඨ
- භාව ප්‍රකෝපවන ආකාරයේ ඡායාරූප,චිත්‍ර, කාටූන් ආදිය
- අපරාධ,වංචා,දූෂණ,දිවිනසා ගැනීම් ආදී සිදුවීම් භාවාතිශය ලෙස වාර්තා කිරීම
- සිද්ධි වාර්තාකරණයේ දී යොදා ගන්නා ආවේගාත්මක භාෂාව
- යුධ පුවත්පත් වාර්තාකරණයේ දී යොදාගන්නා ඡායාරූප හා භාෂාව
- දැන්වීම්වල දී යොදාගන්නා වර්ණ,ඡායාරූප,වාක්‍ය ඛණ්ඩ
- ලිංගිකත්වය හුවාදක්වන දැන්වීම් සහ වාර්තා
- ගැටුම් සම්බන්ධ විස්තරාත්මක තොරතුරු දැක්වීම
- ජාතික, වාර්ගික, කුල, ආගමික, සංස්කෘතික සහ දේශපාලනික ගැටුම් වලට හේතුවන ආකාරයෙන් සිදුවීම් වාර්තා කිරීම.
- අසමබර තොරතුරු වාර්තාකරණය
- මතභේදාත්මක තොරතුරු වාර්තාකරණය
- ගෘහස්ථ ගැටුම් ඉස්මතු කරමින් සිදුවීම් වාර්තා කිරීම
- සංස්කරණය කළ යුතු වුවද එසේ නොකර මුල් ස්වරූපයෙන්ම ඉදිරිපත් කිරීම
- අපරාධ වාර්තා කිරීම සඳහා විශේෂ පිටු/ අතිරේක වෙන් කිරීම

**නම් කිරීමට ලකුණු 1/2 × 4 = 2**

**විස්තර කිරීමට ලකුණු 2 × 1 = 2**

**මුළු ලකුණු = 4**

| |
|---|
| (iii) දුර්වල ශ්‍රවණ හැකියාවක් ඇති වීමට හේතුවන කරුණු **තුනක්** නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. |

- නිසි අවධානයක් නොමැති වීම
- උනන්දුවක් නොමැති වීම
- අවශ්‍යතාවක් නොමැති වීම
- සංජානනය දුර්වල වීම
- භාෂාව ග්‍රහණය කර ගැනීමට ඇති අපහසුව
- භාෂාව තේරුම් ගැනීමේ ඇති අපහසුව
- ශාරීරික දුබලතා
- පාරිසරික දුබලතා
- සන්නිවේදන උපකරණ හා මෙවලම්වල දෝෂ පැවතීම
- ධ්වනි තාරතාවේ පවතින සීමාවන්
- සන්නිවේදකයා තුළ පවතින දුබලතා

**ලකුණු** 2 × 3 = **6**

**(සම්පූර්ණ ලකුණු ලබා දීම සඳහා ප්‍රමාණවත් ලෙස නිදසුන් සපයා තිබිය යුතුය.)**

| |
|---|
| (iv) 'ඕපාදූපදාමය' කෙටියෙන් හඳුන්වා ඕපාදූප පාදක කොට ගෙන සමාජ ගැටුම් ඇති විය හැකි ආකාරය පිළිබඳ කරුණු **තුනක්** නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න. |

- **එක් අයෙකු විසින් අනෙක් සියලු දෙනාට තොරතුරු ලබා දීම නිශ්චිත මූලාශ්‍රයකින් තොරව අවිධිමත් ලෙස සන්නිවේදන ක්‍රියාවලිය සිදුවේ.**
(කෙටි විස්තරයක් ඇතුළත් විය යුතුය)

**ලකුණු** 2 × 1 = **2**

- අනවබෝධය
- අවිශ්වාසය
- සැකසංකා ඇති වීම
- නිවරදි තොරතුරු නොලැබීම
- පුද්ගලයාගේ මානසික හා චර්යාත්මක ස්වභාවය මත
- ද්වේශ සහගත තොරතුරු
- අතිශයොක්තියෙන් යුක්තව තොරතුරු ඉදිරිපත් කිරීම
- සමාජ පිළිගැනීම අභියෝගයට ලක් වීම
- නිවැරදි තොරතුරු මූලාශ්‍ර වෙත යොමු නොවීම
- තොරතුරු පැතිරීම පාලනය කිරීමට අසීරු වීම

**(සම්පූර්ණ ලකුණු ලබා දීමට, කරුණු 03 ක් නිදසුන් සහිතව පැහැදිලි කළ යුතුය)**

**ලකුණු** 2 × 3 = **<u>6</u>**

**මුළු ලකුණු = <u>8</u>**

**4.** (i) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය ප්‍රශස්ත ව පවත්වාගැනීම සඳහා ප්‍රගුණ කළ යුතු නිපුණතා **හතරක්** නම් කරන්න.

- සහානුභූතිය (සහවේදනය)
- අභ්‍යාසය
- ආවර්ජනය
- විවිධ මූලාශ්‍ර මගින් විවිධාකාර වූ තොරතුරු සමුදායක් මනසේ රැස් කර ගැනීම
- පුද්ගලයෙකු විසින් මනසෙහි රැස් කර ගෙන ඇති විවිධ දේ අතුරින් තමන්ගේ සන්දේශයට අවශ්‍ය තොරතුරු පමණක් තෝරා ගැනීම.
- තාර්කිකව තීරණ ගැනීම මගින් සන්දේශයේ ස්වභාවය නිගමනය කර ගැනීම.
- අවශ්‍යතාවට ගැළපෙන පරිදි සන්දේශය නිර්මාණය කර ගැනීම.
- යෝග්‍ය පරිදි සන්දේශය ඉදිරිපත් කිරීම
- නිර්මාණාත්මක හැකියාව
- දියුණු භාෂාත්මක හැකියාව
- ස්ව සංකල්ප පෝෂණය
- ප්‍රශස්ත ඉන්ද්‍රීය ක්‍රියාකාරීත්වය සඳහා සිත හසුරුවා ගැනීම

**ලකුණු** 1/2 × 4 = **2**

(ii) "පුවත්පත් නිර්මාණාත්මක සන්නිවේදනයේ මූලාරම්භයන්ගෙන් එකකි." ඉහත අදහස තහවුරු කිරීමට කරුණු **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

- නව ලේඛන ආකෘති බිහිවීම
- නව ලේඛන ශෛලීන් බිහිවීම
- ඡායාරූප සහ පෙළ (text) සුසංයෝගීව ඉදිරිපත් කිරීම
- සංකීර්ණ සමාජ දේශපාලනික අදහස් චිත්‍ර,කාටූන් වැනි නිර්මාණ මගින් ඉදිරිපත් කළ හැකි වීම
- පාඨක අවශ්‍යතා ප්‍රභේදකරණයට ලක් කර තොරතුරු ඉදිරිපත් කිරීම
- විවිධ ප්‍රමාණයේ පුවත්පත් බිහිවීම.
- විවිධ ප්‍රකාශන විධි ක්‍රම හා විවිධ ස්වරූපයේ තොරතුරු අභිසාරීව ඉදිරිපත් කළ හැකිවීම
- පුවත්පත මගින් විවිධ සම්ප්‍රදායේ භාෂා භාවිතයන් සංවිධානාත්මක වීම,විධිමත් වීම,ප්‍රකාශන ශක්තිය වර්ධනය වීම
- අදහස් ආකර්ශනීය ලෙස ඉදිරිපත් කිරීමට හැකිවීම.
- විවිධ නිර්මාණකරුවන් බිහිකිරීම (කවීන්, ලේඛකයින්)

**ලකුණු** 2 × 2= **4**

(iii) "ජනප්‍රිය සංස්කෘතිය සමාජ පරිහානිය කෙරෙහි ද බලපෑ හැකි ය." මෙම අදහසට පක්ෂ ව කරුණු **තුනක්** ඇසුරෙන් විවරණයක් කරන්න.

- සාම්ප්‍රදායික සංස්කෘතික වටිනාකම යටපත් කිරීම
- සාම්ප්‍රදායික සමාජයේ මානව සබඳතා වාණිජකරණයට ලක් වීම
- නිස්සාර වූ හිස් අපේක්ෂාවන් හා ක්‍රියාවන් කරා යොමු වීම
- නොගැළපෙන පාරිභෝගික රටාවකට යොමු වීම
- ආර්ථික, සමාජීය, මානසික ව්‍යසනකාරී තත්ත්වයන්ට යොමු වීම.
- ජනප්‍රිය සංස්කෘතියේ ගොදුරක් බවට පත්වීඇති බව නොතේරීම
- අන්තර්ගතයේ වටිනාකම් වලට වඩා බාහිර ස්වරූපයට යොමු වීම
- සරල හා කෙටිකාලීන පැවැත්ම/දිගුකාලීන පැවැත්මක් නොමැතිවීම
- සමාජ වටිනාකම්,චින්තනය,සංවේදීතාව,බුද්ධි මට්ටම් යනාදිය වෙළඳපොළ අවශ්‍යතාවන්ට අනුගත කිරීම
- නිර්මාණකරණ පුනරුක්තියෙන් මිදීමට නොහැකිවීම.

**ලකුණු 2 × 3= 6**

(iv) "ගැටුම් සමාජයේ ප්‍රගමනයට ආධාරකයකි."

ඉහත තේමාව යටතේ ඊට පක්ෂ ව කරුණු **දෙකක්** හා විපක්ෂ ව කරුණු **දෙකක්** පදනම් කර ගනිමින් පාසල් සඟරාවකට වචන 250කට නොඅඩු ලිපියක් සකස් කරන්න.

**පක්ෂව**

- අභියෝග වලට මුහුණදීමේ හැකියාව ඇතිවීම
- සමාජය තුළ ඇතිවන ගැටුම් සමාජ සාධනීය පරිවර්තනයකට යොමු කර ගැනීම(විපරිවර්තනය)
- නවෝත්පාදනයන් සඳහා මාර්ගය විවර වීම
- සමාජ ජීවිතයේ යථාර්ථය හඳුනා ගැනීමට හැකි වීම
- සමාජයේ පවතින ගතානුගතික, පසුගාමී තත්වයන්ට එරෙහිව සමාජය තුළ නව ප්‍රබෝධාත්මක,සක්‍රිය තත්වයක් ඇති වීම
- ගැටුම් පාදකව පුළුල් වපසරියකට ප්‍රවේශ වීම සඳහා නව කතිකාවත් ගොඩනැගීම
- සමාජ හා පුද්ගල නිර්මාණකරණයෙහි ලා ගැටුම නව උත්තේජකයක් වශයෙන් ක්‍රියා කිරීම
- ගැටුම, පොදු භාවයන් සහ අනන්‍යතාවන් ගොඩනගා ගැනීමට ආධාර වීම

**විපක්ෂව**

- සමාජය තුළ බෙදීම් ඇති කිරීම
- සමාජ ශක්තිය දුර්වල කරවීම
- සමාජය අර්බුද කරා මෙහෙයවීම
- ජීවිත හා දේපළ හානි සිදුවීම
- මානව අයිතිවාසිකම් බිඳවැටීම
- සමාජ සදාචාරය හා වටිනාකම් පරමාදර්ශ බිඳවැටීම
- සමාජ අවිනිශ්චිතතා වර්ධනය වීම
- අප්‍රසන්නතාව වර්ධනය වීම
- පුද්ගලයාගේ විභව ශක්තිය දුර්වල වීම
- සහජීවනයට බාධා ඇති වීම
- පුද්ගල හුදෙකලාබව ඇති වීම

**පක්ෂව ලකුණු 2 ×2 = 4**
**විපක්ෂව ලකුණු 2 × 2 = 4**
**මුළු ලකුණු = 8**

**(සඟරාවක පළවන ලිපියක ආකෘතිය තිබිය යුතුය)**

**5.** "සමාජයක යහපැවැත්ම උදෙසා මාධ්‍ය පුළුල් කාර්යභාරයක් ඉටු කරයි."

(i) බහුසංස්කෘතික සමාජයක සහජීවනය සඳහා මාධ්‍ය කටයුතු කළ යුතු ආකාර **හතරක්** නම් කරන්න.

- සංවාද මණ්ඩපයක් බවට පත්කිරීම.
- විවිධ සංස්කෘතික හරපද්ධතීන් මතුකර පෙන්වීම.
- සංස්කෘතික, වාර්ගික, ආගමික ආරක්ෂකයකු ලෙස කටයුතු කිරීම.
- සැගවුණු න්‍යාය පත්‍රයක් නොමැතිවීම.
- මාධ්‍ය නියෝජනය නිසි ලෙස ක්‍රියාත්මක වීම තුළ සැමට සම අවස්ථා උදාකර තිබීම.
- විනිවිදභාවය සහිත අගතීන්ගෙන් තොරව තොරතුරු ඉදිරිපත් කිරීම.
- ගැටුම්කාරී පරිසරයක් ඇති නොවන ලෙස කටයුතු කිරීම.
- වාර්ගික සංස්කෘතික ආගමික වටිනාකම් සම්බන්ධයෙන් දැඩි වටිනාකමකින් කටයුතු කිරීම.
- මාධ්‍ය හැකි තරම් මහජන කේන්ද්‍රිය වීම.

**ලකුණු** 1/2 × 4 = 02

(ii) සන්නිවේදනය සමාජය සඳහා වැදගත් වන ආකාරය පිළිබඳ කරුණු **හතරක්** නම් කොට, ඉන් **දෙකක්** පිළිබඳ ව විස්තර කරන්න.

- තොරතුරු සම්පාදනය
- පාර්ශව අතර සම්බන්ධතා
- සමාජ ඒකාබද්ධතාව ඇතිකිරීම
- සමාජ සංවර්ධනයට පෙළඹවීම
- උපදෙස්සම්පාදනය
- දැනුම ලබාගැනීමට
- ගැටුම්අවමකර ගැනීමට
- මිත්‍ර / ඥාතිසම්බන්ධතා වර්ධනය
- සමාජ ආයතන ගොඩනැගීම
- පුද්ගල සම්බන්ධය මතුකරදැක්වීම
- සමාජ ක්‍රියාකාරීත්වය හැසිරවීම
- විශ්‍රාන්තිය ලබා ගැනීම/විනෝදය ලබා ගැනීම

**නම් කිරීමට** 1/2 ×4 = 2
**විස්තර කිරීමට** 1 ×2 = 2
**මුළු ලකුණු** = 4

(iii) විවිධ ආගමික උපසංස්කෘතීන්ට අයත් පවුල් අතර මහජන සම්බන්ධතාව ප්‍රවර්ධනය සඳහා උපයෝගි වන ආගමික උත්සව **දෙකක්** නිදසුන් ඇසුරෙන් විස්තර කරන්න.

- වෙසක් උත්සවය
- පොසොන් උත්සවය
- ඇසළ උත්සවය
- නත්තල් උත්සවය
- පාස්කු ඉරිදා මංගල්‍යය
- මහා සිකුරාදා උත්සවය
- දීපාවලී උත්සවය
- මහා ශිව රාත්‍රී උත්සවය
- තෛපොංගල් උත්සවය
- රාමසාන්උත්සවය
- හජ්ජිඋත්සවය

**ආදී උත්සව දෙකක් විස්තර කිරීමට ලකුණු** 3 × 2 = 06
**(අදාළ උත්සව තුළ මහජන සම්බන්ධතාව ගොඩනැගෙන ආකාරය විස්තරකර තිබිය යුතුය)**

(iv) සමාජය තුළ සාමය පවත්වා ගැනීම සඳහා ඔබ කැමති ඕනෑ ම ආගමකට අයත් **ඉගැන්වීම් දෙකක්** හඳුන්වා ඉන් **එකකට** නිදසුන් **දෙක** බැගින් ගෙන එහි ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

**බෞද්ධ ආගම**

- වෛරයෙන් වෛරය නොසන්සිඳේ.
- පන්සිල්
- නිදහස් චින්තනයට ඇති අවකාශය
- අවෛරයෙන්ම වෛරය සන්සිඳේ.
- නිවැරදි දෘෂ්ටිය, නිවැරදි සංකල්පය, නිවැරදි වචනය, නිවැරදි ක්‍රියාව, නිවැරදි ජීවිකාව, නිවැරදි උත්සාහය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය.
- කාලාම සූත්‍රය
- නිදහස පිළිබඳ
- මෛත්‍රිය හා අවිහිංසාව

**කිතුනු ආගම**

- සෑම මනුෂ්‍යයෙක් ම දේව දරුවෙකි.
- සුවය දානය කිරීම.
- ජීවිතයේ උත්පාදකයා දෙවියන් බවත් ඒ නිසාම ජීවිතය දෙවියන් සතු බව.
- චේතනාව යහපත් වීම.
- ක්‍රිස්ත්‍රියානි දස පනත.
- ඔබට මෙන්ම ඔබේ අසල්වැසියන්ට ද ප්‍රේම කිරීම
- ඔබ දෙවියන්ට ප්‍රේමකරමි යි යමෙකු පවසන්නෙ ්නම්, ඔහු බොරුකාරයෙකි. තමන් දකින සහෝදරයාට ප්‍රේම නොකරන තැනැත්තාට නොදකින දෙවියන්ට ප්‍රේම කළ නොහැකිය.
- මිනිසුනි, ඔබට යමක් කරනවාට ඔබ කැමතිද? එය ම ඔවුන්ට ද කරන්න. නීතියත්, දිවැස් වාක්‍යයත් එයයි.

**ඉස්ලාම් ආගම**

- ''මවනු ලැබ ඇති සියලු දෙනාම දෙවියන් වහන්සේ ගේ පවුලට අයත් ය. දෙවියන් විසින් මවන ලද දෑ කෙරෙහි, කාරුණික වන අය කෙරෙහි දෙවියන් වහන්සේ ද කාරුණික වේ.'' - මුහම්මත් නබිතුමන්ගේ දේශනය -
- සහෝදරත්වය පිළිබඳව හැඟීම
- එකිනෙකාට අපහාස නොකරන්න.
- අල්ලාහ්ගේ මෙහෙකරුවනි, එකිනෙකාට ඊර්ෂ්‍යා නොකරන්න. එකිනෙකා අතර සහෝදරත්වයෙන් ජීවත්වන්න. - මුහම්මත් තුමාණෝ -
- සමගිව ජීවත් වන්න, එකිනෙකට විරුද්ධව කුමන්ත්‍රණයනොකරන්න. - මුහම්මද් තුමාවදාලහ -
- ඔබගේ ක්‍රියාවන් ඔබටම ය. මාගේ ක්‍රියාවන්ට ඔබ වගකිවයුතු නැත. ඔබේ ක්‍රියාවන්ට මා වගකිව යුතු නැත. - කුර්ආනය්

**හින්දුආගම**

- සාමය පිළිබඳ භාවනාව (සාම මන්ත්‍රය)
- සියලු මිනිසුන් උපතින් සමානයහ. ඔවුන් අතර දක්නට ලැබෙන වෙනස්කම් වනාහි ඔවුනොවුන් විසින් තෝරාගනු ලැබූ ඒ ඒ වෘත්තිය පාදක කොටගෙන අත්පත් වූ ප්‍රතිඵල මිස අනෙකක් නොවේ. - තිරුක්කුරාල් ග්‍රන්ථය -
- මිනිස් වර්ගයා අන්‍යොන්‍යයන් කෙරෙහි සහෝදර ආකල්පයකින් පැවතිය යුතුය. - හින්දු ආගමික සාහිත්‍යය-
- කිසිම යහපතක් නොකරන්නේවුවද, අනභිමුඛයෙහි දෝෂාරෝපණය නොකරන්නේ නම් එය ප්‍රමාණවත්ය. (තිරුක්කුරාල් ග්‍රන්ථය)
- මේ අපේ මිනිසාය. මේපිට මිනිසාය යනුවෙන් භේදයක ්නොතකා දෙන දෙයක් සැමට දයාවෙන් දෙන්න........(තිරුමන්තිරම් ග්‍රන්ථය)
- සෑම රටක්ම මගේ ය. ඒ රටවල වෙසෙන සියළුම ජනයා මගේ නෑදෑයෝය. (පුරාණනූරු ග්‍රන්ථය)
- කිසිදු ලාබ ප්‍රයෝජනයක් නොලද තැනට කරන යහපත වෙනුවෙන ්අහස සහ පොලොව යන දෙකම පිරිනැමුව ද නොසෑහේ. (තිරුක්කුරාල් ග්‍රන්ථය)

**ලකුණු 4 × 2 = 08**

**(එක් ඉගැන්වීමකට නිදසුන් දෙකක් තිබිය යුතුය)**

**6.** (i) ජාතික වශයෙන් අර්බුධාත්මක අවස්ථාවල දී රජය විසින් මාධ්‍ය සන්දේශ වාරණය භාවිතයට ගනු ලබයි. සමාජ මාධ්‍ය වාරණය කිරීම නිසා සමාජයට සිදු වූ යහපතට සහ අයහපතට අදාළ ව කරුණු **දෙක** බැගින් නම් කරන්න.

**යහපත**

- සමාජ තුළ ව්‍යාජ තොරතුරු ව්‍යාප්තිය වැළකීම .
- වෛරී ප්‍රකාශන වැළැක්වීම.
- සමාජය තුළ සාවද්‍ය තොරතුරු ව්‍යාප්තිය වැළකීම.
- ආචාර ධර්ම උල්ලංඝනය වීම වැළකීම.
- සමාජය තුළ ගැටුම් ඇතිවීම වැළකීම.
- සමාජයේ ව්‍යාකූල තත්ත්වයන් පාලනය කිරීමට හැකිවීම.
- පුද්ගල හා ජන වර්ග වලට සිදුවන අපහාස වැළැක්වීම.
- අසභ්‍ය සහ අශ්ලීල ප්‍රකාශන ජනගත වීම වැළැක්වීම.
- නෛතික තත්ත්වයන්ට අනුකූලව සමාජ පාලනය ගෙන යාමට හැකිවීම.
- මාධ්‍යයන් ගෙන් තහවුරු කළ නිල ප්‍රකාශන ලබා ගැනීමට හැකිවීම.
- පුද්ගල බද්ධ අදහස් ප්‍රකාශනය සීමාවීම.

**අයහපත**

- නිදහස් අදහස් ප්‍රකාශනය සීමාවීම.
- තොරතුරු දැන ගැනීමේ නිදහස උල්ලංඝනය වීම.
- සමාන්‍ය ජනතා හඬ යටපත්වීම.
- අධිපතිවාදී මතවාද ශක්තිමත් වීම.
- අවිධිමත් සන්නිවේදනය ශක්තිමත් වීම.
- මාධ්‍ය හා බැඳි ව්‍යාපාර ක්ෂේත්‍රය බිඳ වැටීම.
- නිර්මාණශීලී චින්තනයට බාධා ඇතිවීම.
- ජනමත නිර්මාණයට බාධා ඇතිවීම.
- විකල්ප මාධ්‍ය ක්‍රියාකාරීත්වය දුර්වල වීම.
- නිල නොවන ප්‍රකාශන බිහිවීමේ ප්‍රවණතාව වර්ධනය වීම.

**යහපත** 1/2 × 2 = 1
**අයහපත** 1/2 × 2 = 1
**මුළු ලකුණු** = 2

(ii) මහජන සම්බන්ධතා කටයුතු සඳහා ෆේස්බුක් (Facebook) මගින් ලබා ගත හැකි ප්‍රයෝජන **හතරක්** දක්වා ඉන් **එකක්** පැහැදිලි කරන්න.

- ක්ෂණික ප්‍රතිචාර ලබාගත හැකිවීම.
- මාධ්‍ය අභිසාරිතාව.
- ක්ෂණිකව සම්බන්ධ කරගත හැකිවීම.
- තොරතුරු අතිවිශාල පිරිසක් අතර හුවමාරු කරගත හැකිවීම.
- නව සම්බන්ධතා ගොඩනගා ගැනීමට හැකිවීම.
- එක් අයෙකුගෙන් බොහෝ දෙනෙකුටත් බොහෝ දෙනාගෙන් තවත් බොහෝ දෙනෙකුටත් යමක් බෙදා හැරීමට හැකිවීම.
- භාණ්ඩ හා සේවාවන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට හැකිවීම.
- දේශපාලන ප්‍රතිරූප ඉහළ නැංවීමට හැකිවීම.
- අගය විශේෂී ග්‍රාහක පිරිසක් වෙත ළගාවියහැකිවීම.
- පිරිවැය අවම වීම.
- කාලය සහ අවකාශය අතර සීමා ජයගත හැකි වීම
- අධිපාඨ (Hyper text)මගින් වැඩි තොරතුරු ලබාගත හැකිවීම
- ව්‍යාපාරික අවශ්‍යතා ඉටුකර ගත හැකි වීම

**නම් කිරීම ලකුණු** 1/2 ×4 = 2
**පැහැදිලි කිරීම ලකුණු** 2 × 1 = 2
**මුළු ලකුණු** = 4

(iii) "ප්‍රස්තාව පිරුළු ස්වදේශීය දැනුම හා ප්‍රඥාව පිළිබිඹු කරයි." ප්‍රස්තාව පිරුළුවල පවතින සන්නිවේදනාත්මක වැදගත්කම කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

- ප්‍රඥාව සක්‍රීය කිරීම.
- නිර්මාණශීලීව අදහස් ප්‍රකාශ කිරීමට හැකි වීම.
- පුළුල් අදහසක් සංක්ෂිප්ත කොට දැක්වීම.
- ආස්වාදජනකව අදහස් ප්‍රකාශ කිරීමට හැකි වීම.
- සමාජයට අවශ්‍ය උපදේශාත්මක දැනුම ලබාදීම.
- සමාජයේ පුද්ගලයින් අතර සම්බන්ධතාවන් ගොඩනැගීම.
- නිර්මාණාත්මක චින්තනය ප්‍රබුද්ධ කිරීම.
- සන්දේශ සංජානනයට හා අවබෝධයට පහසුවීම.

**ලකුණු** 2 × 3 = 6

(iv) සංවර්ධන ව්‍යාපෘතියක දී ඇගයුම් ක්‍රියාවලියෙන් අපේක්ෂා කරන්නේ කුමක් ද යන්න කරුණු **හතරක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

- ව්‍යාපෘතියේ ක්‍රියාකාරී අවස්ථා තක්සේරු කිරීම.
- වර්තමාන තත්ත්වය අවබෝධ කරගැනීම.
- කාල රාමුවට ගැළපෙන බව සොයා ගැනීම.
- ව්‍යාපෘතිය සංශෝධනය කිරීම.
- ව්‍යාපෘතිය තක්සේරු කිරීම.
- ව්‍යාපෘතියේ ප්‍රබලතා දුබලතා හඳුනාගැනීම.
- අයවැය කළමනාකරණය කර ගැනීම.
- කාර්යක්ෂමතාව තක්සේරුකිරීම.
- ක්‍රියාකාරී අවස්ථා හා ස්වරූප නිසිලෙස තක්සේරු කර ගැනීම.
- ගැටලු,සීමා, අභියෝග හඳුනා ගැනීම.
- ව්‍යාපෘතිය ප්‍රශස්ත ලෙස සකසා ගැනීමේ හැකියාව.

**ලකුණු** 2 × 4 = 8

**7.** සන්නිවේදන ක්‍රියාවලියේ දී මෙන් ම විචාර ක්ෂේත්‍රයේ දී ද මාධ්‍ය සාක්ෂරතාව වැදගත් වේ.

(i) මාධ්‍ය සාක්ෂරතාවෙහි ප්‍රධාන සංකල්ප **හතරක්** දක්වන්න.

- සියලු මාධ්‍ය සන්දේශ විශේෂ අරමුණක් වෙනුවෙන් ගොඩනගයි.
- මධ්‍ය යථාර්ථය ගොඩනගයි. (මාධ්‍යකෘතයථාර්ථය)
- ග්‍රාහකයා තමන්ට අදාළව මාධ්‍ය සන්දේශයන්ට අර්ථ සපයාගනු ලැබේ.
- බොහෝ විට මාධ්‍ය සන්දේශයන් ලාභය අරමුණු කරගෙන ක්‍රියාත්මක වේ. (වාණිජ්‍යමය වේ.)
- මතවාද හා වටිනාකම් මාධ්‍ය සන්දේශයන්ට ඇතුළත් වේ.
- සමාජ හා දේශපාලන ඇගයුම් මාධ්‍ය සන්දේශයන්ට ඇතුළත් වේ.
- මාධ්‍ය සන්දේශයන්හි අන්තර්ගතය හා ආකෘතිය එකිනෙකට සමීපව සම්බන්ධ වේ.
- සෑම මාධ්‍ය සන්දේශයකම සුවිශේෂී සෞන්දර්යාත්මක ලක්ෂණ පවතී.

**ලකුණු** 1/2×4 = 2

(ii) වර්තමානයේ මාධ්‍ය දේශ දේශාන්තර ව බලපෑම් කිරීමේ සාධකයක් බවට පත් ව ඇත. ගෝලීය මාධ්‍ය ජාතික සංස්කෘතිය කෙරෙහි බලපා ඇති අයුරු කරුණු **දෙකක්** ඇසුරෙන් විචාරශීලී ව විස්තර කරන්න.

- සාම්ප්‍රදායික සමාජ සංස්කෘතික වටිනාකම් හා පරමාදර්ශ වෙනස් කිරීම
- නව සංස්කෘතීන් සමාජගත වීම
- බටහිර සමාජ සංස්කෘතික වටිනාකම් ජාතික සංස්කෘතියේ වටිනාකම් සමග ගැටීම
- ආහාර සංස්කෘතිය වෙනස්වීම
- මානව සම්බන්ධතා වාණිජකරණය වීම
- නව සංස්කෘතික අංග හඳුන්වාදීම (උදා - වැලන්ටයින් ඩේ, හැලවන්ස් ඩේ )
- දේශීය සන්දේශ වලට වඩා බටහිර සන්දේශවලට ප්‍රමුඛතාව ලබා දීම
- දේශීය සන්දේශවලට වඩා බටහිර සන්දේශ විශ්වාස කිරීම
- දේශීය තොරතුරු ලබා ගැනීමේදී පවා ගෝලීය මාධ්‍ය මූලාශ්‍ර වෙත යොමුවීම.

  (උදා: ලිප්ටන් වට රවුමේ ශිෂ්‍ය උද්සෝෂණයක් පිළිබඳව දේශීය මාධ්‍ය AFP පුවත් සේවයෙන් උපුටා ගැනීම)
- අධි තොරතුරු ගලනය
- එක්තරා විශේෂිත මාතෘකාවක් පමණක් වාර්තා කිරීම.

  (ගැටුම්, යුද්ධ, ස්වභාවික ව්‍යසන, දේශපාලන අර්බුද, ආර්ථික පිරිහීම ආදී මාතෘකා සෘණාත්මකව වාර්තා කිරීම)
- තොරතුරු අතිශයෝක්තියෙන් වාර්තා කිරීම.

**ලකුණු 2x2=4**

(iii) මාධ්‍ය සාක්ෂරතාව නිපුණතා පාදක වූවකි. එවන් නිපුණතා **තුනක්** විස්තර කරන්න.

- පුද්ගල හා ප්‍රජා අවශ්‍යතාවයට ගැළපෙන ආකාරයට මාධ්‍ය තාක්‍ෂණය ප්‍රයෝජනයට ගැනීම.
- පුළුල් පරාසයක පැතිර ඇති මාධ්‍ය ස්වරූප හා අන්තර්ගතයන් තක්සේරු කිරීම.(ඇගයීම් කුසලතාව)
- මාධ්‍ය නිෂ්පාදනයන් ගේ අරමුණ සහ අවශ්‍යතා අවබෝධකර ගැනීම.
- අදහස් තොරතුරු මතයන් සන්නිවේදනය කිරීම සඳහා මාධ්‍ය නිර්මාණශීලිව භාවිතය.(නිර්මාණය කිරීමේ කුසලතාව)
- මහජන වගකීමෙන් මාධ්‍ය ඵලදායීව භාවිත කිරීම.
- ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් භාවිතයක් ලෙස මාධ්‍ය ඵලදායීව භාවිත කිරීම.
- මාධ්‍ය මගින් සන්දේශ ගෙන යාම සඳහා යොදාගන්නා තාක්‍ෂණය/භාෂාව/චාරිත්‍ර ක්‍රම විචාරාත්මකව විශ්ලේෂණය.( විශ්ලේෂණ කුසලතාව)
- ආනාරාධිතව, ආක්‍රමණශීලිව හා හිංසාකාරී මාධ්‍ය අන්තර්ගතයන් හෝ සේවාවන් හඳුනා ගැනීම / බැහැරකිරීම / ඒවාට අභියෝග කිරීම.(පරිහරණය කිරීමේ කුසලතාව)

**ලකුණු** 2 × 3 = 6

(iv) ගෝලීය සංස්කෘතිය, ජාතික සංස්කෘතිය කෙරෙහි බලපෑනු ලබන ආකාරය පිළිබඳ ව කරුණු **හතරක්** රූපවාහිනී මාධ්‍යය පදනම් කර ගනිමින් විග්‍රහ කරන්න.

- පාරිභෝගික සංස්කෘතියන් ඇති කිරීම.
- ගෝලීය ජනප්‍රිය සංස්කෘතිය ව්‍යාප්ත කිරීම.
- ගෝලීය මාධ්‍ය ආකෘති යොදා ගැනීම.
- චිත්‍රපට, ටෙලිනාට්‍යවල තාක්‍ෂණය විසින් ගොඩනැගූ වීරචරිත ජනප්‍රිය වීම සැබෑ වීරයන් ගිලිහී යෑම.
- ගෝලීය නාලිකා ප්‍රාදේශීයකරණයට ලක්වීම.
- උසස් තාක්‍ෂණයෙන් යුක්ත මාධ්‍ය නාලිකා සමග තරග කිරීමට නොහැකිවීම.
- සමකාලීන මානව සංස්කෘතියේ පවතින නිර්මාණ ගෝලීය සංස්කෘතියේ පවතින නිෂ්පාදන මගින් යටපත් වීම.
- බහුභාණ්ඩකරණයට ලක්වීම.
- ආධ්‍යාත්මික සංස්කෘතිය ඉවත් වී භෞතික සංස්කෘතිය ස්මතුවීම.
- සාමූහික සංස්කෘතිය පුද්ගලවාදී සංස්කෘතියක් බවට පත්වීම.
- මානව සම්බන්ධතා යාන්ත්‍රීකරණය වීම.
- විනෝදාස්වාද සම්පාදනය ප්‍රබල වීම.
- මානවයා හුදෙකලා පුද්ගලයෙකු බවට පත් කිරීම.
- දෘශ්‍ය සංස්කෘතියක් කරා යොමු කිරීම.
- භාණ්ඩ හා සේවා අධික පරිභෝජනයට යොමු කිරීම.
- වාණිජකරණයකට ලක් වීම හා ඒ මත වැඩසටහන් අන්තර්ගතයන්ට බලපෑම් සිදුවීම.
- සමාජයේ ඇතැම් කොටස් නියෝජනය නොකිරීම.

**ලකුණු 2x4= 8**